# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/77 - 2019 අප්‍රේල් මස 12 වැනි සිකුරාදා - 2019.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46 (1) (අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලදුව, වරින්වර සංශෝධනය කරන ලද නිවේදනය, වහාම ක්‍රියාත්මකවන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
ජනාධිපති.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (1) "ආරක්ෂක අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 21 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;
(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 20 සිට නැවත අංකගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි 21 වැනි අයිතමය ඉවත් කිරීමෙන් ;
(ඈ) එහි II වැනි තීරුවෙහි අයිතම 20 සිට නැවත අංකගත කිරීමෙන් ;

1A - G 29887 — 382 (2019/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි අංක (19) "ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය" ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 11 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

12. රජයේ මුද්‍රණ හා ප්‍රකාශන කටයුතු

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 12 සිට නැවත අංකගත කිරීමෙන් ;
(ඇ) එහි II වැනි තීරුවෙහි 7 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

8. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

04 - 1160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.